# සංගීත ශබ්දය හා එහි පාරිභාෂික නිරුක්ති විචාරය

වින්සන්ට් සෝමපාල

''සං'' යන උපසර්ග පදය සංහත, සම්‍යක් යන අර්ථ දෙකෙහි ම යෙදේ. ගැයෙනුයේ ගීත නම්. එවිට ''සංගීත'' යන්නෙහි වාච්‍යාර්ථය ගණයක් විසින් හෝ මැනවින් ක්‍රියාත්මක වන ගීතය විය යුතු ය. වාච්‍යාර්ථය යනු පදයක ප්‍රකෘති මූලික අර්ථයයි. එහෙත් ලෝකයා ඒකල ගීතය ඒකල ගායනය සමූහ ගීතය සමූහ ගායනය ඒකල වාදනය සමූහ වාදනය ආදි වශයෙන් සංගීතයට යා වූ හැම අංශයක් ම මේ සංගීත යන්නෙන් ම හඳුන්වති.

'ගීත' ශබ්දය හා 'සංගීත' ශබ්දය සඳහා පෙරදිග සංගීත සාහිත්‍යයෙහි ප්‍රචලිත නිරුක්ති ලක්ෂ්‍යාර්ථයට මුත් වාච්‍යාර්ථයට බරව සැකැසුණු බවක් නො පෙනේ. ලක්ෂ්‍යාර්ථය යනු පදයක ව්‍යවහාරය අනුව සම්මත වූ අර්ථයයි. ස්වරයන්ගේත් පදයන්ගේත් තාලයන්ගේත් සමන්වය ගීත යි කෙනෙක් පවසති. ස්වරයන්ගේත් පදයන්ගේත් සමන්වය ගීත යී පැවසිණි නම් මේ වඩාත් යෝග්‍ය වන්නට ඉඩ තිබුණි. තාලයෙන් තොරව ස්වරයන්ගේත් පදයන්ගේත් සමන්වය සිදු විය නො හැකි හෙයිනි. මෙහි තාලයන්ගේ යනු අනවශ්‍ය ය. හැකි තාක් කෙටි වීමත් අර්ථාන්විත වීමත් නිරුක්තියක විශේෂ ලක්ෂණ විය යුතු හෙයිනි.

සිත් රඳවන ස්වර සමුදය ගීත යී තව කෙනෙක් දක්වති. සිත් රඳවන ස්වර සමුදය ගීතය නම් පදර්ථයෙන් තොර වාද්‍යය ද ගීතයක් විය යුතු ය. හුදෙක් වාදනය පිණිස පැබැඳුණු තනු ද සමහර පත් පොත් වල ''යන්ත්‍ර ගීත'' නමින් හඳුන්වන ලද්දේ මේ නිසා විය හැකි ය. ස්වර වාද්‍යය ද ගීතයක් වූ විට වාද්‍ය යන්නෙන් ගැනීමට සිදු වනුයේ වාද්‍යභාණ්ඩයන් තබ්ලා, මෘදංග ආදි බෙර විශේෂයන්ගෙන් කෙරෙන ලය වාදනයත් පමණි. සිත් රඳවන ස්වර සමුදය රාගයකැයි ගැනේ නම් කාරණය නිරවුල් වේ.

ගීත යන්නට මෙරට සංගීතඥයන් විසින් සැකැසුණු නිරුක්ති දෙකින් එකකි ''ඇද පදවා ලෙලවා කියැවෙනුයේ ගීත නම්''යනු. ගායනයේ දී නිසර්ගයෙන් සිදුවන පණකුරුවල ඇදීමත් ගමකයන් ස්වර ලාලිත්‍යයත් යන තුනම මෙයින් ව්‍යක්ත වෙයි. ''සුස්වර වර්ණ සමුදය ගීත නම්.'' යනු මෙරට උපන් අනෙක් නිරුක්තියයි. 'සුස්වර' යන්නෙන් නියම කම්පන වාර අනුව ලැබෙන මධුර ස්වරත් 'වර්ණ' යන්නෙන් අර්ථ ප්‍රකාශක වචන උපදවන අකුරු හා අර්ථ ප්‍රකාශක නො වූ (තරාණා ආදි) අක්ෂරත් කියැවෙයි. එවිට මෙහි සංක්ෂිප්තාර්ථය මධුර ස්වරයෙන් යුත් අක්ෂර සමුදය ගීත නම් යනු ය.

''ගීත වාද්‍ය නෘත්‍ය යන තුනෙහි සංහතිය සංගීතයයි''යී කෙනෙක් පවසති. ඉන්දියානු සංගීත ශිල්පීන් අතර බෙහෙවින් පැතිර ගිය නිරුක්තියකි මේ. නෘත්‍යය වාද්‍යය අනුවත් වාද්‍යය ගීතය අනුවත් යන හෙයින් හුදෙක් ගීතය ද සංගීතයයි යී පැරණියන් විසින් පැවසේ. ගීතයෙන් අර්ථ මාධුර්යයත් ස්වර මාධුර්යයත් දෙක ම ලැබේ. වාදනයෙන් ලැබෙනුයේ ස්වර

මාධුර්යය පමණි. එහෙයින් සංගීතයේ මුල්තැන ගීතයට හිමිවේ යි පැවසිණි නම් ඒ කොතරම් සහේතුක ද? ශාස්ත්‍රීය ද? ගීත වාද්‍ය දෙක කණට ගොදුරු ය. එහෙයින් වාද්‍යයට එහි දෙවැනි තැන හිමි විය යුතු ය. නෘත්‍යය හුදෙක් ඇසට ගොදුරු වන්නකි. ඒ හැරත් සංගීත යන වචනයෙහි පද සිද්ධියත් එහි වාච්‍යාර්ථයත් අනුව බලන විට නෘත්‍යය එයින් නො කියැවෙන බව කිය යුත්තකි. එහෙයින් සමහරු ගීත, වාද්‍ය දෙක සංගීතය වශයෙනුත් නෘත්‍යය එයින් අන්‍ය වූ කලාවක් හැටියටත් ගත් බව පෙනේ. සමහරු හුදෙක් වාදනය ම සංගීතය වශයෙන් සලකති. සමහරු සංගීතය පිළිබඳ මේ ත්‍රිත්වයේ තුන්වැනි කලාව වශයෙන් දැක්වෙන නෘත්‍යය එහි ප්‍රථම කලාව වශයෙන් ගත් බව ද පෙනේ.

''ස්වරයන්ගේ මිලනය හෙවත් රැස්වීම සංගීතයයි'' යනු තව ද නිරුක්තියකි. හුදෙක් ස්වර වාදනය හඟවන මේ නිරුක්තිය ''Music is the art of combining sounds'' යන අපරදිග නිරුක්තිය ඇසුරෙන් මෑතක දී යොද ගන්නා ලද්දක් සේ සිතිය හැකි ය. මේ නිරුක්තිය ගීත, නෘත්‍ය යන දෙක ම සංගීතයෙන් ඉවත් කරයි.

ගණයක් විසින් ගැයෙන ගීතය හෙවත් සමූහ ගායනය සංගීතය වශයෙන් සමහරු ගනිති. සංගීත යන වචනයෙහි පද සිද්ධිය අනුව ගත යුතු එක් වාච්‍යාර්ථයකි මෙයින් පැවසෙනුයේ. යථොක්ත නිරුක්තියෙන් ලැබෙන මේ වාච්‍යාර්ථය සංගීතයෙහි උපවිෂය වශයෙන් ගැනෙන වාද්‍ය, නෘත්‍ය යන දෙකලාව ම සංගීතයෙන් ඉවත් කරයි.

සමහරු සංගීත යන්නෙහි අනෙක් වාච්‍යාර්ථය ගෙන සම්‍යක් ගීතය සංගීතයයි පවසති. සංගීත යන්නෙහි පදසිද්ධියත් ලක්ෂ්‍ය (වහරෙහි එන) සංගීතයත් අනුව බලන විට මේ නිරුක්තිය සංගීත යන්න සඳහා පෙර දැක්වුණු හැම නිරුක්තියකට ම වඩා ශාස්ත්‍රීය බවත් හරබර බවත් යෝග්‍ය බවත් පෙනේ. මැනවින් ගැයීමට වාද්‍යය ඉවහල් වේ. එහෙයින් වාද්‍යය සහිතව හෝ රහිතව එකල වශයෙන් යුග වශයෙන් හෝ සමූහ වශයෙන් ගැයෙන හැම ගීතයක් ම මෙයින් ව්‍යක්ත වෙයි. මේ නිරුක්තිය ද වාද්‍යය සංගීතයෙහි උපවිෂයයක් වශයෙන් ගෙන නෘත්‍යය සංගීතයෙන් ඉවත් කරයි.

ගීත යන වචනය වෙනුවට ඉන්දියානු සංගීත සාහිත්‍යයෙහි ඇතැම් තැනක ''ගේය'' යන වචනය යෙදී ඇති බව පෙනේ. සිංහල ගීත සමයයෙහි එන 'ගැයි' යනු මේ 'ගේය' යන්නට සමාන වචනයකි. එහි එන ''මුල් ගැයි, පුන ගැයි, අනුගැයි'' යන වදන් මේ ගැයි යන්න උප පදය කොට ගෙන උපන් බව පෙනේ. මුල් ගැයිය යනු ගීතයෙක මුලින් ගැයෙන කොටස ය. පුන ගැයිය යනු එහි යළින් ගැයෙන කොටස ය. අනුගැයිය යනු පුන ගැයියට අනතුරුව ගැයෙන කොටස ය.

සමූහ ගායන යන අර්ථයෙහි විය යුතු සංගායන යන වචනය බෞද්ධ සාහිත්‍යයෙහි මුත් සංගීත විෂයයෙහි එන බවක් නො පෙනේ. සකුවෙහි පද රූප සිද්ධිය අනුව 'වාදිත' යී ද රූපයක් සංගීත සාහිත්‍යයෙහි විය යුතු වුව ද එය පාලියෙහි මුත් සංස්කෘතයෙහි දුර්ලභ ය. සංස්කෘතයෙහි ඇත ද නැත ද ව්‍යවහාරයෙහි නම් නො ලැබේ. වාසනාවකට මෙන් මේ වචනය අප රට සංගීත සාහිත්‍යයේ බෙහෙවින් යෙදී ඇති බව පෙනේ. වාද්‍ය ශබ්දයෙන් වාද්‍ය භාණ්ඩයත් එයින් ඉදිරිපත් කරනු ලබන වාදනයත් දෙක ම කියැ වේ. එහෙත් මේ වාදිත යන්න යෙදී ඇත්තේ වාද්‍ය භාණ්ඩය හැඟවීමට නො ව එයින් ඉදිරිපත් වන වාදනය හෝ වාදනය පිණිස සකස් වූ තනුව හැඟවීමට පමණි. එහෙයින් සිංහල සංගීත සාහිත්‍යයෙහි එන වාදිත යනු මේ විෂයයෙහි ලා ඉතා ම ප්‍රයෝජනවත් බව කිය යුත්තකි. 'වාදිත්‍ර'යී වචනයක් ද පෙරදිග සංගීත සාහිත්‍යයෙහි එයි. යමකින් වැයේ ද ඒ වාදිත්‍ර නමි. මෙයින් පැවසෙනුයේ වාද්‍ය භාණ්ඩය මිස එයින් නිකුත් වන වාදනය නො වේ.

අපරට සංගීත සාහිත්‍යයට මෑතක දී එක් වූ පාරිභාෂික වචන කිහිපයෙන් සංවාදිත, සංවාදන යන දෙක ඉතා ඉක්මණින් මෙරට සංගීත පරිසරයේ පැතිර ගිය බව පෙනේ. සංවාදිත යන්නෙහි වාච්‍යාර්ථය සමූහ වාදනය පිණිස පැබැඳුණු තනු යනු ය. සංවාදනය යනු සමූහවාදනයයි. සංගීතය වැනි උසස් ශාස්ත්‍රීය විෂයයක එන පාරිභාෂික වචනවල වාච්‍යාර්ථ මුත් ලක්ෂ්‍යාර්ථ ගැනීමත් ලක්ෂ්‍යාර්ථ අනුව නිරුක්ති සැපයීමත් ඒ විෂයට හානිකර බව කිය යුත්තකි.

''සඳපහන'',
පිළියන්දල.